28/03/2012 - ලංකාදීප

**සමාජ විප්ලවයකට මග පෙන්වන ජිනීවා පාඩම - මිලින්ද මොරගොඩ**

ස්විට්සර්ලන්තයේ ජිනීවා නුවර පැවති මානව හිමිකම් කවුන්සලයේ දී ශ්‍රී ලංකාව සම්බන්ධව යෝජනාව හා එහි ඡන්ද විමසීමේ ප්‍රතිඵලය අනාවරණය වී හමාරය. ජය පරාජය කුමක් වුවත් එය මෙරට පාලනයට වැදගත් සන්ධිස්ථානයකි. ජිනීවා සිද්ධිය රටට හැරවුම් ලක්ෂ්‍යයකි. මානව හිමිකම් කවුන්සිලයට අනුව රටේ බරපතල ප්‍රශ්නයක් එහි සාකච්ඡා විය. නමුත් සැබෑ මුහුණුවර කුමක්ද? ඔවුන්ට දැනෙන ප්‍රශ්නය මානව හිමිකම්ය. බලය බෙදාහැරීමය. නමුත් රටේ මහජනතාව විඳවන සැබෑ ප්‍රශ්න ජිනීවා නුවර දී අනාවරණය වූයේ නැත. ත්‍රස්තවාදය අවසන්කර සාමකාමී අලුත් යුගයකට ඇතුලූ වන ශ්‍රී ලංකාව මුහුණ දී ඇති යථාර්ථය එයයි.

ජිනීවා කවුන්සලයට ඉදිරිපත් වූ යෝජනාව හමුවේ ලාංකිකයෝ සියලූ බේද ඉවතලා එකට එකතු විය. වීදි බැස ස්වකීය සහභාගීත්වය පෙන්නුම් කළහ. මානව හිමිකම් කවුන්සිලයට ඉදිරිපත් වූ යෝජනාව කුමක්දැයි වැඩි දෙනෙකුට අවබෝධයක් තිබුණේ නැත. දේශපාලන පක්ෂ, සහ විවිධ මත දරන දේශපාලනඥයෝ එම යෝජනාව ගැන නොයෙක් නිර්වචන ඉදිරිපත් කළේය. ඒවා එකිනෙකට වෙනස්ය. ප්‍රශ්න කිරීමකට නොගිය සමාජයේ කොටස් එය මහා බරපතල දෙයක් බව සිතන්නට පටන් ගත්හ. ජිනීවා කවුන්සිලයට ඉදිරිපත්වූ යෝජනාව දැඩි තීන්දු තීරණ ගත හැකි එකක් නොවන නමුත් එය සන්ධිස්ථානයකි. යෝජනාව සමග ජාත්‍යන්තර බලවතුන්ට ප්‍රවේශවීමේ දොරටුවක් විවර විය. සැලකිය යුතු අවදානමකි. කවුන්සලයට ඉදිරිපත්වූ යෝජනාව අනුව බරපතල තීරණ කරා යොමුවීමේ අවදානමක් ඇති බව ද අත්හැර දැමිය නොහැකි තර්කයකි. නමුත් ජිනීවා හි දී මතුවූ කරුණු හා ශ්‍රී ලංකාවේ යථාර්ථය සමග සසඳන විට, වෙනත් පැත්තක් ද තිබේ. ජාත්‍යන්තර අභියෝගය ට උල්පත ශ්‍රී ලංකාවේ සමාජ දේහයේ පවතින අර්බුදයයි.

ත්‍රස්තවාදය මර්දනය කිරීම ගැන බටහිර රටවල හෝ ඉන්දියාවේ විරුද්ධත්වයක් නැත. එය තේරුම්ගත යුතුය. ඇමරිකාව, යුරෝපීය ප්‍රජාව සහ ඉන්දියාව ඇතුලූ රටවල එල්.ටී.ටී.ඊ තවමත් තහනම් සංවිධානයකි. ගැටුම් අවසන් නමුත්, ශ්‍රී ලංකාවේ ජනවර්ග අතර ප්‍රශ්නයක් ඇතැයි ලෝක බලවතුන් අතර මතයක් තිබේ. දෙමළ ජනතාවට සාධාරණය ඉටුකරන්නැයි ඔවුහු කියා සිටිති. ත්‍රස්තවාදය මැඩපැවැත්වීමෙන් පසු එයට මූලික වූ ජන කොට්ඨාශයට සාධාරණ විසඳුමක් හිමි විය යුතු බව ඔවුන්ගේ අදහසයි. බලය බෙදාහැරීමෙන් ජන වර්ග ප්‍රශ්නයට විස`දමක් දිය හැකි බව ඉන්දියාව කියා සිටියි. 2009 වසරේ දී ජිනීවා නුවර මානව හිමිකම් කවුන්සල සැසිවාරයට ශ්‍රී ලංකාව යෝජනාවක් ඉදිරිපත් කළේය. ව්‍යවස්ථාවේ දහතුන් වැනි සංශෝධනය හා බලය බෙදාහැරීම ගැන එහි ස`දහන් වූ අතර ඉන්දියාව එයට සහය දැක්විය.

ශ්‍රී ලංකාව දේශපාලනය, ජාති, ආගම්, කුළ, පන්ති සහ නාගරික හා ගැමි වශයෙන් භේද ඇති රටකි. එය පිළිගත යුතුය. ජිනීවා හී දි මෙම ප්‍රශ්න ඇති බව දී දැකගත හැකිවිය. ලංකාවේ දේශපාලන වේදිකාවක හැසිරෙන ආකාරයට බෙදීම් දැක්වුණ අතර එය රටේ හරස්කඩක් බව ජාත්‍යන්තර ප්‍රජාව අවබෝධ කර ගත්තේය. මෙම සිද්ධියට පසු ස්වයං විවේචනයකට යා යුතුය. ජිනීවා හි දී මුහුණ දුන් ආකාරය හා එයට ගත යුතුව තිබුණ මග චරිත ඝාතනයෙන් තොර ස්වයං විවේචනයකට ලක් වියයුතුය. අපේ සංස්කෘතියේ ස්වයං විවේචනය නැත. පුද්ගල විවේචනය බහුලය. නමුත් බෞද්ධ රටක් වශයෙන් බුදු රජානන් වහන්සේ පවා ස්වයං විවේචනය පිළිගෙන ඇති බව වටහා ගත යුතුය. කාලාම සූත්‍රයට අනුව බුදු රජානන් වහන්සේ දේශනා කර ඇත්තේ යම් දෙයක් ධර්මයට එකගදැයි විමසා බැලිය යුතු අතර එය රන් කරුවෙකු අතට පත් පිරිසිදු රන් කැබැල්ලක් කපා කොටා පසුව පුලූස්සා එය නියම රත්රන් දැයි විනිශ්චය කරන්නාක් මෙන් සිදුවිය යුතු බව ය. ස්වයං විවේචනය අනුව ජිනීවා නුවර මානව හිමිකම් කවුන්සලයට රුස්වූ රටවල් බෙදීම

හා ශ්‍රී ලංකාව සම්බන්ධ යෝජනාව ඉදිරිපත් කිරීම නොව එයට හේතු වූ කරුණු විමසා බැලීම වැදගත්ය. එයින් නරක අදහස් හෝ රටවල් සමග වෛරයක් ඇති කර ගැනීම නුසුදුසුය. වෛරයෙන් ක්‍රියා කිරීමෙන් රටට යහපතක් සිදුවන්නේ නැත.

ස්වයං විවේචනයේ දී විදේශ සම්බන්ධතා සම්බන්ධයෙන් ප්‍රධාන කරුණු දෙකක් වැදගත්ය. ඉන්දියාව සමග ඇති සම්බන්ධතා දියුණු කරගත යුතුය. පැහැදිලි දේශපාලන අවබෝධයක් ඇති ඍජු රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධතා ඇති කර ගත යුතුය. අපේ අභ්‍යන්තර ප්‍රශ්න හා ඔවුන්ගේ අභ්‍යන්තරය තේරුම් ගෙන විවිධ තලවල නායකයන් අතර සම්බන්ධතා ගොඩනැගීම අවශ්‍යය. ඉන්දියාවේ ප්‍රධාන ඉලක්ක අතර දෙමළ සමාජය හා ශ්‍රී ලංකා-චීන සම්බන්ධතා යන අංශ බව පෙනේ. මෙම කරුණු සම්බන්ධයෙන් ඉන්දියාව සමග සහයෝගයෙන් අපගේ ආත්ම ගෞරවය හා අනන්‍යතාව ආරක්ෂා කරගනිමින් අපට අවශ්‍ය දේ කරගැනීම වැදගත්ය. ප්‍රාන්ත ආණ්ඩු සමග හිතවත්විය යුතුය. අපට අවධානයක් ඇත්තේ තමිල්නාඩුව හා එයින් එන පීඩනය ගැන පමණකි. අනෙක් ප්‍රාන්ත සමීප කරගෙන රටට හිතකර පැත්ත ගැන වෙහෙසිය යුතුය. මෙහිදී සිංගප්පූරුව අධ්‍යයනය කළ හැකිය. සිංගප්පූරුවේ ඇමතිවරුන්ට ඉන්දියාවේ ප්‍රාන්ත සම්බන්ධ කරගැනීමේ වගකීම් බෙදා දී තිබේ. ශ්‍රී ලංකාවේ මැති ඇමතිවරුන්ට ද ඉන්දියාවේ ප්‍රාන්ත සමග සමීප සම්බන්ධතා ඇති කරගැනීම සුදුසුය. 1987 දී දෙරට අතර සම්බන්ධතා නොගැලපුන අවස්ථාවේ ප්‍රශ්න මතුවිය. අවංක සම්බන්ධතාවයකට මග පාදා ගැනීම සුදුසුය. විශාල රටවල් ප්‍රතිපත්ති තීරණ ගැනීමේ දී කාලයක් ගන්නා බැවින් රටවල් අතර සම්බන්ධතාවයෙන් උපායශීලීව ක්‍රියාකළ හැකිවේ.

ඇමරිකාව, යුරෝපය හා සෙසු බටහිර රටවල් මානව හිමිකම් ගැන උනන්දුවක් දක්වයි. මානව හිමිකම් වලට වඩා බලය බෙදාහැරීම හා දෙමල ජනතාවට සාධාරණය ඉන්දියාවට වැදගත්ය. ලෝක ආර්ථික බලවතෙකු හා මෙරට අපනයන සම්බන්ධයෙන් ඇමරිකාව වැදගත්ය. මෙරට අපනයන වලින් සියයට හැටක් යැවෙන්නේ ඇමරිකාව ප්‍රධාන බටහිර රටවලටය. සෙනෙට් සභාව, කොන්ග්‍රස් මණ්ඩලය, ආරක්ෂක දෙපාර්තමේන්තුව වැනි අංශ සමග වෙන වෙනම සම්බන්ධතා ඇතිකරගත හැකිය. කලාපයේ බලවත් රටක් වශයෙන් ඉන්දියාවේ ආර්ථිකය ද අපට වැදගත්ය. මෙම සම්බන්ධතා ඇති කරගත යුතු එම රටවලට අවශ්‍ය හෙයින් නොව ශ්‍රී ලංකාවට උවමනා ආකාරයට හා යුතුකමක් වශයෙන්ය.

ජිනීවා මානව හිමිකම් කවුන්සලයේ දී පැන නැගුණේ උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිසමේ නිර්දේශයි. එය අප විසින් පත් කළ එකකි. එහි නිර්දේශ ක්‍රියාත්මක කළ යුත්තේ ශ්‍රී ලංකාවයි. මානුෂික මෙහෙයුමේ දී, ප්‍රතිපත්තියක් වශයෙන් හෝ උවමනාවෙන් සිවිල් ජනතාව ඝාතනය වන ආකාරයට ශ්‍රී ලංකාව ක්‍රියා කර නැති බව එහි එන වැදගත් නිර්දේශයකි. එය පදනම් කරගෙන එහි දැක්වෙන රටට ගැලපෙන යෝජනා ක්‍රියාත්මක කිරීමේ වගකීමක් අපට තිබේ. යුද්ධය අවසන් වූ වහාම මෙම රටවල් ශ්‍රී ලංකාවට එරෙහිව බරපතල චෝදනා එල්ල කළේය. දැන් ශ්‍රී ලංකාව ඉදිරිපත් කරන උගත් පාඩම් කොමිසමේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම ප්‍රමාණවත් බව පිළිගෙන තිබේ. මෙම පරතරය අඩුවීම සැහෙන වාසිදායක තත්ත්වයකි. අවංකව ගත යුතු කරුණ එයයි. වෛරයෙන් වෛරය නොසන්සිඳෙන අතර අදට ගැලපෙන සංකල්පය සාමකාමී අවස්ථාවේ දී ප්‍රතිසංධානය හා සමාජ එකමුතුව ට වැඩ පිළිවෙලක් ඇති බව ජාත්‍යන්තර ප්‍රජාවට පෙන්වීමයි.

එවැනි මගකට අවතීර්ණ වීම පහසු නැත. කවර නිර්වචනයක සිටිය ද උතුරේ ප්‍රශ්නය විසඳන්නට ඉදිරිපත්වූ ශ්‍රී ලංකාවේ රාජ්‍ය පාලකයන් අවසානයේ දී නොසිතූ අවාසනාවන්ත ඉරණමකට ගොදුරු විය. එය ඉතිහාසය පෙන්වා දෙන පාඩමයි. ජේ. ආර්. ජයවර්ධන ජනාධිපතිවරයා එයට උත්සාහ කළේය. විශාල ජනප්‍රසාදයකින් බලයට පත්වූ නමුත් ඉන්දියානු ආක්‍රමණයකටද, ජන අප්‍රසාදයට ද පත්වූ අතර රට පුරා භීෂණය පැතිරිණ. අනුප්‍රාප්තිකයා වූ ආර්. ප්‍රේමදාස මහතාට ස්වකීය ජීවිතය පූජා කරන්නට සිදුවිය. රනිල්

වික්‍රමසිංහ මහතා වෙනත් කෝණයකින් ක්‍රියාකළ නමුත් රට තුළ දේශපාලන වශයෙන් අභියෝගයකට ලක්විය. චන්ද්‍රිකා කුමාරණතුංග ජනාධිපතිනියට ප්‍රශ්නය විස`දීමේ උවමනාවක් තිබුණ නමුත් එතුමියට ද එය සාක්ෂාත් කරගත නොහැකි වූ අතර භයානක අනතුරකට ද ගොදුරු වන්නට සිදුවිය. ඩී. බී. විජේතුංග මහතා කෙටි කාලයක් බලයේ සිටි හෙයින් තීරණාත්මක තීන්දු වලින් වැලකී සිටි නමුත් මෙම ගැටලුව ට විස`දමක් වෙනුවෙන් ක්‍රියා කළ දෙවන පෙළ නායකයන්ට ද අභාග්‍ය සම්පන්න ගොදුරු බවට පත්විය. මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා ට ත්‍රස්තවාදයට මුහුණ දීමේ දී අලූත් මගක් විවර විය. ත්‍රස්තවාදයට මුහුණ දීමේ ස්වකීය ආත්ම ශක්තියට සමාන්තරව ජාත්‍යන්තර සහය එයයි. ඇමරිකානු 9-11 ප්‍රහාරය සමග ත්‍රස්තවාදයට එරෙහිව ලෝකය පුරා පැන නැගුණ විරෝධය හා ඉන්දියානු අගමැති රජීව් ගාන්ධි ඝාතනයෙන් ඉනික්බිතිව ඉන්දියාව ඉගෙනගෙන තිබුණ පාඩම එහි දී තීරණාත්මකය.

ත්‍රස්තවාදය අවසන් කිරීම සමග මහජනතාව තුළ ජීවිතය සම්බන්ධයෙන් තිබුණ භීතිය පහවී ඇත. මරාගෙන මැරෙන, භයානක සංස්කෘතිය අවසන්ය. නමුත් එයට නොදෙවෙනි අන්දමට මහජනතාවගේ අපේක්ෂා, බලාපොරොත්තු ඉහළ ගොස් තිබේ. පොදු මහජනතාව සාධාරණ අවස්ථා ඇති, යුක්ති ගරුක සැනසිලිදායක සමාජයක් ඉල්ලා සිටියි. උතුරට පමණක් ඇති අසාමාන්‍ය ප්‍රශ්නය කුමක්දැයි විමසන සමාජය රටට ඇති නොවිසඳුන මහජන ගැටලූ පෙන්වා දෙයි. පසුගිය අවුරුදු තිහ තුළ සම්ප්‍රදායික තේ, රබර්, ඇගලූම් ආර්ථිකයට වඩා වෙනස් මගකට රට අවතීර්ණ වූයේ නැත. විදේශ රැකියා මගින් ශ්‍රී ලාංකිකයන් ධනය ඉපැයීම අලූත් අවස්ථාවක් වුවත් එයින් මතු කර ඇති සමාජ ප්‍රශ්න දරුණුය. එහි අතෘප්තිය හා කැකෑරෙන ප්‍රශ්න රට තුළ සිදුවන ඝාතන, මංකොල්ල, පැහැර ගැනීම් සහ මත්ද්‍රව්‍ය උවදුර මගින් පෙන්නුම් කරයි. ආර්ථිකය හා සමාජය පුලූල්වන විට සමාජ විනය ගොඩ නැගේ. අප රට තුළ එය සිදුවන්නේ උවමනා තරමින් නොවේ. දෙමළ ජනතාවට ඇති ප්‍රශ්නය කුමක්දැයි සිංහල ප්‍රජාව අසන අතර රට තුළ දෙමළ ජනගහනය අඩු වී තිබේ. රටින් පිට ගිය දෙමළ ඩයස්පෝරාව ලෝකයේ නොයෙක් තැන් වල හිඳිමින් තමන්ගේ ප්‍රශ්න ගැන කතා කරයි. මුස්ලිම් ජනතාව තමන්ගේ අයිතිය ගැන කතාකරන්නට පටන්ගෙන තිබේ. පන්ති ප්‍රශ්න නිසා තමන්ට අසාධාරණයක් වී ඇතැයි සිතන පිරිස ද සුළු පටු නොවේ. මහින්ද රාජපක්ෂ මහතා අධිරාජ්‍යවාදී යුගයෙන් පසු බිහිවූ රදල වරප්‍රසාද ලත් පැලැන්තියට පිටස්තරව, එම පෙලැන්තිය බිඳිමින් බලයට පත් ප්‍රධාන නායකයාය. ඔහු කෙරෙහි බලාපොරොත්තු තැබූ කණ්ඩායම අද තමන්ට හිමි අවස්ථාව කුමක්දැයි ප්‍රශ්න කරයි. මෙය ඉතා සංකීර්ණ තත්ත්වයකි. මහජන අවශ්‍යතා ඉටුකර රට ගොඩනැගීම විනා වෙනත් විකල්පයක් නැත. මහජන නියෝජිතයන් පාර්ලිමේන්තුවට, පලාත් සභාවට හෝ පලාත් පාලන ආයතනයට යවන මහජනතාව ඉල්ලන්නේ තම දරුවන්ට යහපත් හෙට දවසකි. කුඩා රටක විශාල මහජන නියෝජිතයන් පිරිසක් අපට සිටී. යුද්ධය අවසන් නමුත් මව්බිම තුළ තම දරුවන් ට අනාගතයක් නැති බව ජනතාව විශ්වාස කරන්නේ නම් රටට ප්‍රශ්නයක් තිබේ. විශ්වාසය වැදගත්ය. ''ඉන් බ්ලැක් ඇන්ඩ් වයිට්'' නම් එඔඩ වැඩසටහනට සහභාගී වූ මැලේසියානු හිටපු අගමැති මහතීර් මොහමඩ් මහතාගෙන් එරට දියුණුවට බලපෑ සාධකය කුමක් දැයි මම ප්‍රශ්න කළෙමි. එතුමා කියා සිටියේ තමන් මැලේ ජාතිකයන් තුළ තම මව්බිම කෙරෙහි විශ්වාසයක් ඇති කළ බවය. මහින්ද රාජපක්ෂ ජනාධිපති තුමා ත්‍රස්තවාදය තුරන් කිරීම හමුවේ ලාංකිකයන්ගේ විශ්වාසය දිනාගැනීමට සමත්විය. අද අවශ්‍ය ආර්ථික හා සමාජ දියුණුව සම්බන්ධයෙන් ද අපට, ලාංකිකත්වය කෙරෙහි එවැනි විශ්වාසයක් තහවුරු කර ගැනීම බව පෙනේ. මේ වන විට ශ්‍රී ලංකාවේ තරුණ පරපුර අතරින් වැඩි දෙනෙකු සොයන්නේ රට හැර යන අවස්ථාය. ඒ වෙනුවෙන් ජීවිතය බරපතල අනතුරකට හෙලන්නට වුව ද ඔවුහු සූදානම්ය. මධ්‍යම පන්තියේ දෙමාපියන් වැඩි දෙනෙකු දරුවන් විදේශ ගතකර උසස් අධ්‍යාපනය දෙන්නට උත්සුක වෙති. ප්‍රශ්නය ඇත්තේ එතැනය. කැඩුන, බි`දුන හා බෙදුන සමාජය යළි එකතු වී නැත. රට තුළ සංහිඳියාව, ප්‍රතිසංධානය තහවුරු වී නැත. එය ඉටුකරගන්නේ කෙසේද? නි ිදහසින් පසු කාල සීමාව තුළ රට තුළ විශාල

කැමැත්තක් දිනාගන්නට සමත්වූ දකුණේ නායකයෙකු වශයෙන් රටේ ප්‍රශ්න විසඳන විශ්වාසය දිනා ගැනීමට මහින්ද රාජපක්ෂ මහතා සතුව පුලුල් අවස්ථාවක් තිබේ.

ජිනීවා මානව හිමිකම් කවුන්සලයයට ඉදිරිපත් වූ යෝජනාව රටේ මානව හිමිකම් ගැන කතා කරයි. උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිසමේ වාර්තාව ක්‍රියාත්මක විය යුතු ආකාරය ගැන සොයා බලයි. රටට බලපෑම් එල්ලවෙයි. එහි ඇති ඇතැම් නිර්දේශ සම්බන්ධයෙන් ප්‍රශ්න තිබෙන්නට ඉඩ ඇත. සෑම නිර්දේශයකටම යා යුතු නැත. කරන්නට හැකි දේ ක්‍රියාත්මක කළ යුතුය. එය එක පැත්තකි. අනෙක මෑත ඉතිහාසයේ ශ්‍රී ලංකාවේ රාජ්‍ය පාලකයන් මුහුණදුන් අභියෝගයටම වෙනත් මුහුණුවරකින් ඉලක්කවන්නට මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාට සිදුවී තිබේ. උතුරේ ප්‍රශ්නයට විසඳුමක් වෙනුවෙන් තියුණු බලකිරීමට සමාන්තරව යමින් ජනාධිපති ධූරය තෙක් මහින්ද රාජපක්ෂ මහතා ඔසවා තැබූ සිංහල බලවේගය, උතුරට පමණක් ඇති අසාමාන්‍ය ප්‍රශ්නය කුමක්දැයි තදින් විමසයි. ත්‍රස්තවාදය අවසන් කර සාමකාමී ජන ජීවිතයක් ස්ථාපිත කර ගතවූ වසර තුනකට ආසන්න කාලය තුළ මෙම අන්ත දෙක ඔස්සේ සියුම් දෝලනයක් පැවතින. අවසන් හෝරාව උදා වී තිබේ. ශ්‍රී ලංකාවේ පමණක් නොව රාජ්‍ය නායකයාගේ ද අනන්‍යතාවය උදෙසා අලුත් ශ්‍රී ලංකාවක් ගොඩනැගිය යුතුය.

අද රටට අවශ්‍ය සම්පූර්ණ පෙරැලියකි. විප්ලවයකි. ලේ හලන විප්ලවයක් නොව ප්‍රජාතන්ත්‍රවාදී සාධනීය විප්ලවයකි. මෙරට පොදු ජනතාව දීර්ඝ කාලයක් විදවන ප්‍රශ්න වලින් මුදවන මෙහෙයුමකි. ජාත්‍යන්තර බලවතුන් නගන හ`ඩ ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර අර්බුදයේ ඔවුන් දකින කෝණයයි. සම්පූර්ණ ව්‍යුහයට විනා ප්‍රශ්නයේ කොටසක් වන උතුරට පමණක් විස`දුමක් සැපයීම සමාජ උන්නතියට හේතුවක් නොවේ. රජය දැනටත් උතුර වෙනුවෙන් විශාල සංවර්ධනයක නිරතය. මානුෂික මෙහෙයුම අවසානයේ ත්‍රස්තවාදය පරාජය කර ඇතත් එවැනි භයංකාර අන්තවාදයකට හේතු වූ පසුබිමට උත්තර ලැබී නැත. දෙමළ ජනතාව නගන හ`ඩ එයයි. ලෝකය පුරා පැතිරී සිටින දෙමළ ඩයස්පෝරාව අත ඇති බරපතල සාධකය එයයි. සමස්ථ ශ්‍රී ලාංකිකයන්ට දැනේනනේ ද එයමය. බරපතල ආයතනික, සාමාජයීය හා ආර්ථික ප්‍රතිසංස්කරණයකින් විනා ශ්‍රී ලංකාවේ පවතින මුහුණුවර වෙනස් කිරීම පහසු නැත. එයට සමාජ කැපවීමක් අවශ්‍යය. යුද කාල පරිච්ෙඡ්දයකට පසු ජන අභිවෘද්ධිය ඇති වන්නේ එවිටය.

යුද ගැටුම් පැවති අවුරුදු තිහක කාලය තුළ ලෝකයේ මුහුණුවර වෙනස් වී තිබේ. සමාජය වෙනස් වී ගෝලීයකරණ සමාජයක් බිහිවී ඇත. රටින් පිට සිටින ලක්ෂ සංඛ්‍යාත රට වැසියන් ලෝකයේ දියුණුව හා ලංකාවේ පවතින තත්ත්වය දකින අතර ඔවුහු ඒ ගැන අදහස් දක්වති. යුද අන්ධකාරයෙන් මිදී වර්තමානයට අවතීර්ණ වී ඇති අවස්ථාවේ දී මහජනතාව බලා සිටින එතෙක් අත පසුවූ පරිසරය ස්ථාපිත කර ගත යුතුය. එය උතුරට පමණක් නොව මුලූ රටට ම දැනෙන අවශ්‍යතාවයි. ප්‍රජාතන්ත්‍රවාදය, ආර්ථිකය හා සමාජය තුළ ඇති දැවෙන ප්‍රශ්න ඉදිරියට ගැනීම වටී. ප්‍රජාතන්ත්‍රවාදයේ බටහිර අංග රටට සම්පූර්ණයෙන්ම ගැලපෙන්නේ නැති බව ද තේරුම් ගැනීම වටී. ලිබරල් ප්‍රතිපත්ති සුපිරි අන්දමින් ක්‍රියාත්මක වුවහොත් එයින් පාලනයට අභියෝග එල්ල විය හැකිය යන කරුණ ද ඇත්තකි. නමුත් ගෝලීයකරණ යුගයේ ජාත්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදයේ වෙනස්කම් වලින් ඈත්වීමට වඩා එයට මුහුණ දී එයට මඳක් ඉදිරියෙන් උපායශීලීව සිටීම යහපත්ය. බටහිර දියුණුවට වඩා ඉදිරියෙන් සිටින රටවලට ලෝකයේ ඇති අවස්ථා වැඩිය. බටහිර අංග සියයට සියයක් නොගැලපෙන්නේ නම් අපට තේරුම්ගත හැකි මහජනතාව නගා සිටුවන පාලන ක්‍රමයක් රටට අවශ්‍යය. අද මෙරට දේශපාලන පක්ෂ පිරිහී තිබේ. ඒවා ගැන මහජනතාව බලන්නේ ප්‍රසාදයෙන් නොවේ. දේශපාලනඥයන් කෙරෙහි ගෞරවයක් නැත. ඡන්ද ක්‍රමය, මැතිවරණයකට කරන වියදම මහජනතාව බලාපොරොත්තු නැති එකකි. එය දූෂණයට හා වංචා වලට ඉඩ දී ඇති බව මහජනතාවගේ තීන්දුවයි. අධිකරණය කෙරෙහි ගෞරවය පිරිහී තිබේ. යුක්තිය ඉටු කර ගැනීමට ගතවන කාලය හා එයට යෙදවිය යුතු ධනය සාමාන්‍ය ජනතාවට ඉහිලූම් නොදේ.

කාන්තාවට නිසි තැන හිමි විය යුතුය. ආර්ථිකය කෙසේ වෙතත් දේශපාලන කටයුතු වලදී ඇය ගේ සහභාගීත්වය දුර්වලය. තොරතුරු දැනගැනීමේ අයිතිය, සංඝ කතිකාවත, පුරවැසියන්ට බලය හිමිවන ආකාරයට බලය බෙදාහැරීම, දරුවන්ගේ අනාගතය සුරක්ෂිත කරන අධ්‍යාපනය, නිසි සෞඛ්‍ය පහසුකම් සහ ලාංකිකයන්ට සමාන අවස්ථා හිමිවීම වැනි පැති ගැන සොයා බැලිය යුතුය. මේවා පිළිගත හැකි සම්මත තත්ත්වයක නැත. ආර්ථිකය ප්‍රශ්න සහගතය. රාජ්‍ය ආයතන අකාර්යක්ෂමය. පාඩු ලබයි. රජයේ සේවය විශාලය. එයින් ඉටුවන සේවාව ගැන මහජනතාව තෘප්තිමත් නැත. එහි ප්‍රතිසංස්කරණ විය යුතුය. ආර්ථික වර්ධනය සෑම ජනකොටසකටම දැනෙන්නට අවශ්‍යය. නමුත් අකාර්යක්ෂම, එහි බර, පීඩාව, සමාජයේ සෑම ජන කොසකට ම දැනේ. පවතින ස්වභාවය වෙනස් නොකිරීම භයානකය. ප්‍රශ්න විසඳීමට කල්මැරිය හැකිය. එවිට එහි ප්‍රජාතන්ත්‍රවාදී මුහුණුවර වෙනස්වෙයි. මහජන විරෝධය උත්සන්න විය හැකි අතර අවසානයේ දී සාහසිකත්වය දක්වා ඇවිලෙන්නට ඉඩකඩ ඇත. අතීතයේ එයට උදාහරණ තිබේ. ජාත්‍යන්තර සමාජය තුළ විවිධ රටවල එය සිදුවෙමින් පවතී. එය යථාර්ථයයි. ජිනීවා හි දී මෙම යථාර්ථය ඉස්මතු වූයේ නම් නිකුත්වන පණිවුඩය වෙනස් එකකි. සිවිල් සංවිධාන හා ජන මාධ්‍ය පවා ක්‍රියාකළේ මෙම තත්වය පෙන්වන ජන උවමනාව අනුව නොවේ. සිවිල් සංවිධාන, ජන නායකයින් හා නිදහස් මතධාරීන් දැන් හෝ මෙම අලුත් ව්‍යුහය ගැන සංවාදයක් ඇරඹිය යුතුය. මෙරට සංවර්ධනයට දායකවන පුද්ගලික අංශයට ද එහි වගකීමක් තිබේ.

මෙම තත්ත්වය වෙනස් කළ හැක්කේ කෙසේද? එය ගැඹුරු අවධානයට යොමු වියයුතු එකකි. සමාජ සම්මුතිය ගොඩනැගිය යුතුය. අලුත් පදනමක්, අලුත් සංස්කෘතියක් රට තුළ බිහි කළ යුතුය. රට කලින් තිබුණ සාමකාමී සැනසිලිදායක යුගයට ආපසු හැරවීම අවශ්‍යය. යුද්ධය නිසා පොලිස් නිලධාරියාට බැටන් පොල්ලේ සිට ටී පනස් හය භාවිතය දක්වා ගමන් කරන්නට සිදුවිය. එය සංකේතයකි. පොලිස් නිලධාරියා යළිත් බැටන් පොල්ල සමග මහජන සම්බන්ධතා ඇතිකර ගත යුතු සේ ත්‍රස්තවාදය හමුවේ වේගයෙන් විකෘති වූ අංග යළි පැරණි වු‍්‍යුහයට පරිවර්තනය විය යුතුය. හමුවේ මහජන විශ්වාසය බිඳී ඇති ආයතනික ව්‍යුහය වෙනුවට අලුත් රාමුවක් සකස් කළ යුතුය. එය වර්තමාන රජයට, රජයට සම්බන්ධ දේශපාලන පක්ෂවලට පමණක් නොවේ. මෙරට ඇති සියලූ දේශපාලන පක්ෂ, ආගමික සංවිධාන හා සමාජ නායකයන්ට පොදු සිද්ධාන්තයකි. මේ සියලූ ව්‍යුහ කැඩී බිඳී භේද භින්න වී තිබීමෙන් පෙන්වන්නේ එකගතාවයක් නැති කමයි. නිසි එකගතාවයක් හා ප්‍රතිසංවිධානයක් වෙනුවෙන් විශාල නායකත්වයක් අවශ්‍යය. දේශපාලන කුණාටු, ගැටුම් හා මත බේධ අතර රටට අවශ්‍ය පුලුල් සමාජ නායකත්වයක් බිහිකරන්නට ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා සමත්ව තිබේ. ත්‍රස්තවාදයට මුහුණ දී රට එකතු කළ මෙම අවස්ථාවේ සමාජ එකගතාවයට බලපාන සියුම් තැන් විමසා එයට නායකත්වය සැපයීම ට සාධාරණ අයිතියක් රාජ්‍ය නායකයාට ඇත. රටට ගැලපෙන දේශපාලන ක්‍රමය, ව්‍යවස්ථාව, පක්ෂ හා එහි පොදු ප්‍රතිපත්ති, මැතිවරණ ක්‍රමය, ජන්ද පවත්වන ආකාරය, පලාත් හා ප්‍රාදේශීය පරිපාලනය, රාජ්‍ය සේවය, අධ්‍යාපනය වැනි නොයෙකුත් පැති සම්බන්ධයෙන් ගත යුතු මග කුමක්ද? මේවා වෙනස්කළ යුතු නම් එය කළ හැකිය. බුද්ධ දේශනාවේ සඳහන් වන පරිදි දියුණුවට මග සාමයයි. සාමය නැති තැන සංවර්ධනයක් නැත. සමාජ සම්මතයෙන් පාලන ක්‍රමය තෝරා ගෙන ඇත්තේ ප්‍රශ්න විසඳාගෙන අභිවෘද්ධිය ඇති කර ගන්නටය. එහි ගැටලූවක් ඇත්නම් සාකච්ඡාවෙන් සම්මුතියෙන් අලුත් පිළිවෙතකට ගමන් කිරීමේ රාමුව සකස් කර ගැනීමේ රන් යතුර ඇත්තේ අප අතය. ජිනීවා කවුන්සලයට හෝ බලවත් රාජ්‍යයක බලකිරීමට එය ලඝු විය යුතු නැත. මෙහිදී මහජනතාව නගන හඩ වැදගත්ය. සුළු පිරිසක ගේ ඝෝෂාවෙන් ජනතා හඩ යටපත්වී ඇති බව පෙනේ. ජනතාව බලවත් විය යුතුය. ජනතාවගේ හඩ නැගෙන විට එය තේරුම් ගැනීම අත් හරින්නට නොහැකි බලකිරීමකට යටත්ය. මේ ගැන ඔබගේ අදහස email@milinda.org මගින් සංවාදයට යොමු කළ හැකිය.